


ඉරිදා මව්බිම පුවත්පතේ (ජන. 08, 2023), "මෙරට ආබාධිත ජන ප්‍රජාව ගෙන් 57%ක් කාන්තාවෝ" යන සිරස්තලයෙන් යුතුව පළවී තිබූ ලිපිය ඔස්සේ, ආබාධ සහිත පුද්ගලයින් සමාජය තුළ කොන් වීමට ලක් වීමේ සමාජ ගැටලුවට පිළියම් සෙවීම සම්බන්ධයෙන්, ධනාත්මකව සාකච්ඡා කරයි. එය සැබැවින්ම සැබැවින් ම ප්‍රශංසා කටයුතු වේ.

එනමුත්, ලිපි සිරස්තලය තුළ "ආබාධිත" යනුවෙන් ආබාධ සහිත වූවන්ව හඳුන්වා දී තිබිණි. එසේම, ලිපි අන්තර්ගතය තුළ "ආබාධිතයන්", "ශ්‍රවණාබාධිත කෙනෙක්" වැනි යෙදුම් ඔස්සේ ආබාධ සහිත වූවන්ව හඳුන්වා දී තිබිණි. ඒ ආකාරයෙන්ම, "ආබාධ සහිත පුද්ගලයින්" යන යෙදුම ද ලිපියේ තැන් කිහිපයක යෙදී තිබිණි.

ආබාධ සහිතව ජීවත් වන අය හැඳින්වීමේදී පුද්ගල-ප්‍රථම භාෂාවක් භාවිතා කිරීම වඩාත් යෝග්‍ය නොවන්නේද යන පැනය Ethics Eye අපි බොහෝ විට අසමු. එසේ ඇසීමට හේතුව වන්නේ, මෙම ලිපියෙන් ද පෙන්වා දෙන පරිදි, පොදුවේ යම් කිසි තාවකාලික හෝ දීර්ඝකාලීන හෝ ස්ථිර ආබාධයක්/ආබාධයන් සහිතව ජීවත් වන සැමදෙනෙකුටම සමාජය තුළ ගර්හාවකට හෝ කොන් කිරීමකට ලක් නොවී ජීවත් වීමේ ප්‍රවේශයක් ඇති කිරීම සමාජ අවශ්‍යතාවයක් වන හෙයිනි.

පුද්ගල-ප්‍රථම භාෂාවක් (person-first language), නැතිනම් අනන්‍යතාවය-ප්‍රථම භාෂාවක් (identity first language) ඔස්සේ සිදු කෙරෙන්නේ, ආබාධයක් සහිත පුද්ගලයෙකුව හැඳින්වීමේදී, ආබාධය මූලික කොට නොගනිමින්, පුද්ගලයාව හෝ අනන්‍යතාවය මූලික කොට ගනිමින් ඔවුන්ව ඇඳින්වීමයි.

1) මෙම සිරස්තලයේ සහ අන්තර්ගතය තුළ යෙදී ඇති "ආබාධිත", "ශ්‍රවණාබාධිත" වැනි යෙදුම් වෙනුවට, ලිපියේ අන්තර්ගතය තුළ සඳහන් වන "ආබාධ සහිත පුද්ගලයන්" යන හැඳින්වීම, පුද්ගල-ප්‍රථම භාෂාවකට වඩාත් නොගැලපෙන්නේ ද?

2) එසේත් නැතිනම්, පුද්ගල-ප්‍රථම භාෂාවකට වඩාත් ගැලපෙන වෙනත් යෙදුමක් ඔබට යෝජනා කළ හැකිද?

මූලාශ්‍ර:
https://ncdj.org/style-guide/
https://pwd.org.au/wp-content/uploads/2019/08/PWDA_LanguageGuide_A5_WEB.pdf
https://adata.org/factsheet/ADANN-writing

නම් ඔබ දකිනා මාධ්‍ය ආචාර ධර්ම කඩකිරීම් මෙම Google පෝරමය (https://forms.gle/u5a5n5dJPDerh3Le7) පිරවීම මගින් අපිට එවන්න. නැතිනම් එම මාධ්‍ය ආචාර ධර්ම කඩකිරීම් අපගේ සමාජ මාධ්‍ය පර්යන්තයන් හරහා අප වෙත එවන්න.